සැ. යු. - 2015.10.30 වැනි දින පළ වූ අංක 1,939 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,940- 2015 නොවැම්බර් මස 06 වැනි සිකුරාදා - 2015.11.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1926 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1929 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1934 |

සැ. යු. - ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත සහ 2016 මුදල් වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 නොවැම්බර් මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 නොවැම්බර් මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1925- B 80999- 5,402 (2015/11)
2 B 4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

මගේ අංකය : KUR/HC/ACC/F13/18/2015.

**මහාධිකරණය - කුරුණෑගල**

අධිකරණවල රාජසන්තක කරන ලද නඩු භාණ්ඩ ටෙන්ඩර් මගින් විකිණීම

පහත සඳහන් අධිකරණයන්හි රාජසන්තක කරන ලද වාහන පහතින් දක්වා ඇති අධිකරණයන්හි දී 2015.11.06 දිනට පසු අදාළ අධිකරණයන්හි රෙජිස්ට්‍රාර්වරුන් මගින් පරීක්ෂා කිරීමට හැකියාව ඇති අතර, මීට අදාළ ටෙන්ඩර් ලියකියවිලි කුරුණෑගල මහාධිකරණය මගින් 2015.11.06 දින සිට 2015.11.20 දින දක්වා නිකුත් කරනු ලැබේ. මේ සඳහා ආපසු නොගෙවන රු. 100 ක පෝර්ම ගාස්තුවක් කුරුණෑගල මහාධිකරණයට ගෙවිය යුතු ය. මීට අමතරව රු. 10,000 ක ආපසු ගෙවන ඇප තැන්පත් මුදලක් ටෙන්ඩර් පෝර්ම ලබා ගන්නා අවස්ථාවේ දී ගෙවිය යුතු ය. අනෙකුත් විස්තර හා කොන්දේසි ටෙන්ඩර් ලියවිලි සමග ඔබට සපයනු ලැබේ. සියලුම මුදල් ගෙවීම් කටයුතු කාර්යාල දිනයන්හි දී පෙ. ව. 8.30 සිට ප. ව. 3.00 දක්වා සිදුකළ හැකි ය. 2015.11.23 වැනි දින ප. ව. 2.00 ට ටෙන්ඩරය විවෘත කිරීමට නියමිතය.

**භාණ්ඩ පිළිබඳ විස්තරය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන වර්ගය* | *ලියාපදිංචි අංකය* | *එන්ජින් අංකය* | *චැසි අංකය* | *පරීක්ෂා කළ හැකි ස්ථානය* | *පරීක්ෂා කිරීම සඳහා අවසර ලබා ගත යුතු නිලධාරියා* |
|---|---|---|---|---|---|---|---|
| 01. | 12070 | ටාටා වර්ගයේ ලොරි රථය | 41-6185 | 692D01-256875 | 344073249631 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, නිකවැරටිය | රෙජිස්ට්‍රාර් |
| 02. | B-800/11 (86176) | ලොරි රථය | LF - 9431 | 490 QB 0805701 A | LSCAC13T 98E001241 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, වාරියපොල | රෙජිස්ට්‍රාර් |
| 03. | 91089 | ලොරි රථය | 43-5537 | 4 D31- A-54380 | FE 4342 A-67864 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, වාරියපොල | රෙජිස්ට්‍රාර් |
| 04. | B 84/14 (95230) | ලොරි රථය | 41-6551 | - | KAD527349167 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, වාරියපොල | රෙජිස්ට්‍රාර් |
| 05. | 7150 | බජාජ් ත්‍රීවිල් රථය (කළු) | QZ-5394 | AAMBTA 04966 | MDZAAAA ZZTWA03246 | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, නිකවැරටිය | රෙජිස්ට්‍රාර් |
| 06. | 45839/12 | ලියාපදිංචි නොකළ කුබෝටා ඇග්‍රෝ ට්‍රැක්ටරය | - | - | | මහෙස්ත්‍රාත් අධිකරණය, කුරුණෑගල | රෙජිස්ට්‍රාර් |
| 07. | 21879/10 | ලියාපදිංචි නොකළ ට්‍රැක්ටරය සහ ට්‍රේලරය | - | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, කුරුණෑගල | රෙජිස්ට්‍රාර් |
| 08. | 22205/ MT | ලොරි රථය | 40 ශ්‍රී 7015 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, කුරුණෑගල | රෙජිස්ට්‍රාර් |
| 09. | B/2334/12 B/2694/13 | ත්‍රීරෝද රථය | NWQC 5398 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, කුරුණෑගල | රෙජිස්ට්‍රාර් |

| අනු. අංකය | නඩු අංකය | වාහන වර්ගය | ලියාපදිංචි අංකය | එන්ජින් අංකය | චැසි අංකය | පරීක්ෂා කළ හැකි ස්ථානය | පරීක්ෂා කිරීම සඳහා අවසර ලබා ගත යුතු නිලධාරියා |
|---|---|---|---|---|---|---|---|
| 10. | 72890 | ලොරි රථය | 27 ශ්‍රී 7759 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, පිලැස්ස | රෙජිස්ට්‍රාර් |
| 11. | 74707 | ලොරි රථය | NWJM-6199 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, පිලැස්ස | රෙජිස්ට්‍රාර් |
| 12. | 73262 | ලොරි රථය | NWLB-8066 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, පිලැස්ස | රෙජිස්ට්‍රාර් |
| 13. | 60528 | ලොරි රථය | NWGU 6498 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, පිලැස්ස | රෙජිස්ට්‍රාර් |
| 14. | 69912 | ත්‍රිරෝද රථය | NWQQ 1678 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, පිලැස්ස | රෙජිස්ට්‍රාර් |
| 15. | 73856 | ලොරි රථය | NPHO 4977 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, පිලැස්ස | රෙජිස්ට්‍රාර් |
| 16. | 62141 | වෑන් රථය | 250-4931 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, පිලැස්ස | රෙජිස්ට්‍රාර් |
| 17. | 10950 | ඉසුසු එල්ෆ් ලොරි රථය | 27-9802 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, රඹඩගල්ල | රෙජිස්ට්‍රාර් |
| 18. | 8694 | ඉසුසු එල්ෆ් ලොරි රථය | 41-2520 | - | - | මහෙස්ත්‍රාත් අධිකරණය, රඹඩගල්ල | රෙජිස්ට්‍රාර් |

11-10

---

**මහාධිකරණය - මොණරාගල**

රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

මොණරාගල මහාධිකරණයේ හා වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු විභාගය අවසන්ව රාජසන්තක කරන ලද පහත උපලේඛනයේ සඳහන් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

02. ටෙන්ඩර්පත් මොණරාගල මහාධිකරණය විසින් නිකුත් කරනු ලබන අයදුම්පත් පමණක් විය යුතු අතර, 2015.11.06 වැනි දින සිට 2015.11.30 වැනි දින දක්වා මොණරාගල මහාධිකරණයේ කාර්යාලයෙන් රු. 100 ක් ගෙවා ටෙන්ඩර්පත් ලබාගත හැකි ය.

03. ටෙන්ඩර්පත් පිටපත් 02කින් යුක්ත විය යුතු අතර, ඉන් එකක් මුල් ලේඛනය ලෙස ද, අනෙක අනුපිටපත ලෙස ද ලියා 9 x 4 ප්‍රමාණයේ ලිපි කවර දෙකක දමා එම කවර දෙක ඊට ප්‍රමාණයෙන් විශාල කවරයක බහා ඉදිරිපත් කළ යුතු ය. එසේ ම එක් එක් වාහන සඳහා වෙන වෙන ම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු ය.

04. ටෙන්ඩර්පත් ලියාපදිංචි තැපෑලෙන් "රෙජිස්ට්‍රාර්, මහාධිකරණය, මොණරාගල'' යන ලිපිනයට තැපැල් මගින් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු අතර, ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ අංක ................ දරන වාහනය සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන් කළ යුතු ය.

05. මෙම මිළ ගණන් 2015.12.01 වැනි දින පෙ. ව. 10.00 ට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතු ය. එම වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී ආපසු ගෙවනු ලබන පහත සඳහන් පරිදි ඇප තැන්පතුවක් මොණරාගල මහාධිකරණයේ තැන්පත් කර ඊට නිකුත් කළ කුවිතාන්සියේ පිටපතක් ටෙන්ඩර්පතට අමුණා තිබිය යුතු ය.

07. 2015.11.06 දින සිට මෙම වාහන අතරින් අංක 01 - 03 දරන වාහන මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් මහතාගේ අවසරය ඇතිව මොණරාගල මහාධිකරණයේ දීත්, අංක 04 දරන වාහනය වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර් මහත්මියගේ අවසරය ඇතිව වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දීත් සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 9.00 සිට ප. ව. 4.00 දක්වා පරීක්ෂා කර බැලිය හැකි ය.

08. ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරුවන් වෙත මොණරාගල මහාධිකරණය ලියාපදිංචි තැපැල් මගින් දන්වා යවනු ලබන අතර, එදින සිට සති 02ක් ඇතුළත සම්පූර්ණ මුදල් වාහන රඳවා ඇති අධිකරණයේ එකවර තැන්පත් කර වාහනය ඉවත් කර ගත යුතු ය. එසේ නොවන අවස්ථාවන් හි දී අදාළ ටෙන්ඩර්කරුගේ තැන්පත් ඇප මුදල රාජසන්තක කරනු ලැබේ. එසේ ම අදාළ කාලය තුළ මුදල් ගෙවීමට අපොහොසත් වුවහොත් තක්සේරු මුදලට වැඩියෙන් ඊළග වැඩිම වටිනාකමට ඉල්ලුම් කර ඇති ටෙන්ඩර්කරු වෙත ටෙන්ඩරය පිරිනමනු ලැබේ.

09. 2015.12.01 වැනි දින ප. ව. 2.00 ට මොණරාගල මහාධිකරණයේ දී ටෙන්ඩර් පත් විවෘත කරනු ලබන අතර, ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගි විය හැකි ය. එසේ නියෝජිතයෙකු සහභාගි කරන අවස්ථාවකදී කොන්දේසි පත්‍රය සමග අමුණා ඇති ආකෘතිය සම්පූර්ණ කර එවිය යුතු ය. ටෙන්ඩර්කරුගේ හෝ නියෝජිතගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

10. ටෙන්ඩර් භාර ගැනීම විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතුවන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම් දුරකථන අංක 0552276696 ඔස්සේ මොණරාගල මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් ලබා ගත හැකි ය.

*උපලේඛනය*

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහනයේ ලියාපදිංචි අංකය* | *වර්ගය/මාදිලිය* | *ඇප තැන්පතු රු.* | *වාහනය පරීක්ෂා කළ හැකි ස්ථානය* |
|---|---|---|---|---|---|
| 01. | 106/2014 | UP QQ 5492 (ලි. ප. කළ හැකිය) | Motor Tricycle (Bajaj) | 2,000 | මහාධිකරණය, මොණරාගල |
| 02. | 112/2014 | SP PS 4437 (ලි. ප. කළ හැකිය) | Motor Lorry (DAIHATSU) | 5,000 | මහාධිකරණය, මොණරාගල |
| 03. | 121/2014 | UP BAQ 01 31 (ලි. ප. කළ හැකිය) | Motor Cycle (Bajaj) | 2,000 | මහාධිකරණය, මොණරාගල |
| 04. | බීආර් 512/06 (34404) | අමතර කොටස් සඳහා | Motor Lorry | 1,000 | දිසා/මහසේත්‍රාත්, අධිකරණය, වැල්ලවාය |

ඒ. කේ. එම්. පටබැඳිගේ,
මහාධිකරණ විනිසුරු,
ඌව පළාත් බද මහාධිකරණය,
මොණරාගල.

2015 ඔක්තෝබර් මස 19 වැනි දින,
මොණරාගල ඌව පළාත්බද මහාධිකරණයේ දී ය.

11-81

# රජයේ නොවන දැන්වීම්

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් දැනුම් දෙන ලද්දේ 2015.06.08 වැනි දිනැති ඔක්ලැන්ට් දිස්ත්‍රික්කයේ නොතාරිස් වන Christopher John Davis විසින් සහතික කරන ලද පුත්තලම, ජෝසප් වාස් පාර, කෝවිල් පටුමග, අංක 10 A හි පදිංචි ඒහාම්පරම් පුලේන්දිරන් යන අයට P. o. Box No. 101768, Croft Field Lane North Shore 0745, Auckland, New Zea land හි පදිංචි මුත්තයියා ජෙයසීලන් වන මා විසින් ලබාදුන් ඇටෝර්නි බලපත්‍රය 2015.10.16 වැනි දින සිට අවලංගු කර අහෝසි කරන ලදී. මෙදින සිට ඇටෝර්නි බලකරු විසින් ඉහත සඳහන් ඇටෝර්නි බලපත්‍රය යටතේ කරන ලද කිසියම් ක්‍රියාවලට සහ පියවරවලට මා වගකියනු නොලැබේ.

මුත්තයියා ජෙයසීලන්.

2015 ඔක්තෝබර් මස 16 වැනි දින.

11-06

---

### ඇටොර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් කැෂ්මි වාසනා කපුවැල්ල විසින් 2014.06.09 වැනි දින ලියා සහතික කළ අංක 59 දරන ඇටර්නි බලය මගින් අපගේ ඇටෝර්නි බලකරු ලෙස බත්තරමුල්ල, වික්‍රමසිංහපුර, 9 වන පටමුග, අංක 51/10 සී, යන ලිපිනයෙහි පදිංචි බුලත්වත්තේ වලව්වේ කිත්සිරි නිෂාද් දිසානායක වෙත කර ඇති පත්කිරීම සහ එම අංක 59 දරන ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවට සියලුදෙනා වෙත මෙයින් දන්වමු.

11-13/1

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් කැෂ්මි වාසනා කපුවැල්ල විසින් 2014.06.09 වැනි දින ලියා සහතික කළ අංක 58 දරන ඇටර්නි බලය මගින් අපගේ ඇටෝර්නි බලකරු ලෙස දෙහිවල, කලුබෝවිල, සුනන්දාරාම පාර, අංක 19/6ඒ, යන ලිපිනයෙහි පදිංචි චමින්ද්‍ර කිලිට්ටුව ගමගේ වෙත කර ඇති පත්කිරීම සහ එම අංක 58 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවට සියලුදෙනා වෙත මෙයින් දන්වමු.

11-13/2

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගමේ නාමය යථා පරිදි වෙනස් කර ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

*(අ)* සමාගමේ පෙර නාමය : එම්. ආර්. හෙන්රි ඇන්ඩ් කම්පණි (පීවීටී) එල්ටීඩී

*(ආ)* සමාගමේ අංකය : පී වී 103523

*(ඇ)* ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 72 මනතුංග මාවත, හෝමාගම

*(ඈ)* සමාගමේ නව නාමය : ග්‍රීන් වේව් කන්ස්ට්‍රක්ෂන් (පීවීටී) එල්ටීඩී

ලේකම්.

11-28

---

### මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, ක්වන්ටම් ක්වාර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2015 මැයි මස 26 වැනි දින සිට ලියාපදිංචි කොට ඇති බව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ නම : ක්වන්ටම් ක්වාර්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105865
ලියාපදිංචි ලිපිනය : අංක 105/1, මාදුපිටිය පාර, මහවිල, පානදුර.

රංගනාත් ප්‍රනාන්දු,
(සමාගම් ලේකම්).

11-33

---

### මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, නැවුරබ් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2015 අප්‍රේල් මස 29 වැනි දින සිට ලියාපදිංචි කොට ඇති බව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ නම : නැවුරබ් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105359
ලියාපදිංචි ලිපිනය : අංක 105/1, මාදුපිටිය පාර, මහවිල, පානදුර.

රංගනාත් ප්‍රනාන්දු,
(සමාගම් ලේකම්).

11-34

---

### මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, ස්නැප්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2015 ජූලි මස 15 වැනි දින සිට ලියාපදිංචි කොට ඇති බව මහජනයා වෙත කරන නිවේදනයයි.

සමාගමේ නම : ස්නැප්ස් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 107036
ලියාපදිංචි ලිපිනය : අංක 370 එෆ් 2, වැව පාර, ඇවරිහේන. හෝකන්දර දකුණ.

රංගනාත් ප්‍රනාන්දු,
(සමාගම් ලේකම්).

11-35

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර දැන්වීමයි

සමාගමේ නාමය : කොරියන් ඇල්ෆබට් ග්ලෝබල් ඉන්ස්ට්ට්වු
ලියාපදිංචි අංකය : GA 2605
ලියාපදිංචි කළ දිනය : 2011.09.14
ලියාපදිංචි ලිපිනය : අංක 10, 1 වන චැපල් පටුමග, කොළඹ 06.

අධ්‍යක්ෂක.

11-46

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : සමාධි රෙට්රීට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 108868
ලියාපදිංචි ලිපිනය : නිමල විල F, එපිටමුල්ල පාර, කඹුරුගමුව, මාතර.

සෙක්‍රටේරියස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පීවී 5958

11-50

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

වත්තල, ඇවරිවත්ත පාරේ, එඩ්වර්ඩ් පටුමගේ වින්ස්ටන් පාර්ක් හි, අංක 24/25 හි පදිංචි කොඩිකාර ආරච්චිගේ සෙබස්තියන් ජෙරල්ඩ් පෙරේරා වන මා විසින් 2010 ජූලි මස 5 වැනි දින දතම දරන හොංකොංහි නෝර් ලංකා මැනුෆැක්චරින් ලිමිටඩ් මගින් මා වෙත ප්‍රදානය කරන ලද, හොංකොං SAR හි ප්‍රසිද්ධ නොතාරිස් ස්ටීවන් ෂියු - කී චවු විසින් 2010 ඔක්තෝබර් මස 6 වැනි දින ලියා සහතික කරන ලද ඇටර්නි බලය, මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට, අහෝසි කොට අවලංගු කරනු ලබන බවත්, මෙම ඇටර්නි බලය මින් මතුවට නීතිය ඉදිරියේ කිසිදු බල පැවැත්මක් සහ/හෝ බලයක් නොමැති බවත්, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවටත් පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

කේ. එස්. ජෙරල්ඩ් පෙරේරා.

11-51

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) ඡේදය

සමාගමේ නම : ඒසියා ඇඩ්වයිසරස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 108632
ලියාපදිංචි කාර්යාලය : 26 මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, එච්ලන් චතුරශ්‍රය, කොළඹ 1

සමාගමේ නම : ඒවමෝ කෝපරේෂන් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 108667
ලියාපදිංචි කාර්යාලය : අංක 10 ඒ, මල්වත්ත ඇවනිවු, කොහුවල, නුගේගොඩ.

සමාගමේ නම : විලා සබ්ලයිම් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 108715
ලියාපදිංචි කාර්යාලය : අංක 18, 4 වන පටුමග, නෙලුම්පුර, රත්මලාන.

සමාගමේ නම : කොන්කෝඩ ඉන්ටර්නැෂනල් හෝල්ඩිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 107678
ලියාපදිංචි කාර්යාලය : අංක 51/1, මීගමුව පාර, වත්තල

සමාගමේ නම : අල් මඩීනා රූෆිං (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 108811
ලියාපදිංචි කාර්යාලය : අංක 104, නාරම්මල පාර, අස්කම් පොල, සියඹලාගස්කොටුව.

සමාගමේ නම : බයෝඩයිනමි සිලෝන් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 107885
ලියාපදිංචි කාර්යාලය : දුම්බරාව වතු, පිලාවාල, KY 20196 මහනුවර.

සමාගමේ නම : මාගස්තොට රිසෝට් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 108828
ලියාපදිංචි කාර්යාලය අංක 19, කෑරගල, හේනේගම.

සමාගමේ නම : ජෝනා එන්ටර්ප්‍රයිසස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 109000
ලියාපදිංචි කාර්යාලය : අංක 390/1 බී, කාවන්තිස්ස පාර, අදියර 1, අනුරාධපුර.

11-52

---

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම, 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : එන් එන් ෆැෂන් පුද්ගලික සමාගම
2. සංස්ථාගත කළ දිනය : 2015 සැප්තැම්බර් මස 03 වැනි දින
3. සමාගමෙ අංකය : පී. වී. 108144
4. ලියාපදිංචි ලිපිනය : අංක 232/2/බී, මාකොළ පාර, මාකොළ.

ඩබ්ලිව්. එම් වර්ණ එරන්දි,
සමාගම් ලේකම්.

2015 ඔක්තෝබර් මස 20 වැනි දින දී ය.

11-53

---

## දැන්වීමයි

සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව සංස්ථාපනය කිරීම පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි.

සමාගමේ නම : අල් මනාරා ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108661
ලියාපදිංචි ලිපිනය : 2 වැනි මහල, අංක 24, 2 වැනි හරස් වීදිය, කොළඹ 11.

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

එච් ටී පී බිස්නස් සර්විසස් (පී වී ටී) එල්ටීඩී

අංක 324/1ඒ, ගාළු පාර, කොළඹ 03.

11-65

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එඩ්මන්ටන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාපිත දිනය : 2015.10.06
සමාගමේ අංකය : PV 108881
ලියාපදිංචි කාර්යාලය : අංක 435/ඩී, මොරාවත්ත පාර, නාගොඩ, කඳාන.

සමාගමේ ලේකම්.

11-70

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රය අංක 11639 අවලංගු කිරීමයි

මරඳගහමුල හපුවලාන අංක 15/02 පදිංචි ජා. හැ. අංක 746082711 V හිමි තුම්බුදල් මුදියන්සේලාගේ හේමමාලා වන මා විසින් මිනුවන්ගොඩ මැඩැමුල්ල අංක 94/ඒ හි පදිංචි ජා. හැ. අංක 575570305 V හිමි තුන්බුදල් මුදියන්සේලාගේ මාලාකාන්ති යන අය වෙත බලය පැවරූ ඒ. ඒ. ආර්. ආරියතිලක මහත්මයාගේ අංක 11639 හා 2014.01.11 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය 2015.09.10 වැනි දින සිට බල රහිත කර අවලංගු කරන බව මෙයින් දන්වා සිටිමි.

එම ඇටෝර්නි බලපත්‍රයෙන් බලය පැවරූ සියලුම ක්‍රියාවලින් ඇය ඉවත් කරන බවත්, මින් ඉදිරියට ඇය විසින් ඊට අදාළව සිදු කරන කිසිදු ක්‍රියාවකට එකී ඇටෝර්නි අධිපතිනිය වන මම වග නොකියන බව මෙයින් ප්‍රකාශ කරමි.

11-72

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඒ ඒ ෆාමා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 105948
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 107, විජය කුමාරතුංග මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05.
ලියාපදිංචි දිනය : 2015.05.29

සමාගමේ නම : අයියර් කෝපරේට් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 106692
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 242, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
ලියාපදිංචි දිනය : 2015.07.03

සමාගමේ නම : කායෝ ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 106083
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 5/3, සීවලී පටුමග, වත්තල
ලියාපදිංචි දිනය : 2015.06.05

සමාගමේ නම : රුමෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 105635
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 49/2, කුරුප්පු මාවත, මිනුවන්පිටිය, පානදුර
ලියාපදිංචි දිනය : 2015.05.15

සමාගමේ නම : තායි හෙල්ත් කෙයා මැනේජ්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 106110
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 107, විජය කුමාරතුංග මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05
ලියාපදිංචි දිනය : 2015.07.02

(ඉහත සඳහන් සමාගම හි ලේකම්වරු)

11-84

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර නිවේදනයයි

නම : ශ්‍රී බී එන් බී (පීවීටී) එල්ටීඩී,
ලියාපදිංචි අංක : PV 97413
දිනය : 2014.03.06
ලිපිනය : අංක 171, කඩුවෙල පාර, ගණහේන, බත්තරමුල්ල.

නම : සිලෝන් ට්‍රැන්ක්විලිටි ටීස්, (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක : PV 106756
දිනය : 2015.07.06
ලිපිනය : අංක E/106, 18 ලේන්, ඉසුරුපුර, මාලඹේ.

නම : එපික් එන්ටර්ටේන්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංක : PV 107138
දිනය : 2015.07.17
ලිපිනය : අංක 7047, ශ්‍රී සිද්ධාර්ථ පාර, කිරුළපන, කොළඹ 05.

සමාගම් ලේකම්වරු.

11-93

---

## අවසන් මහා සභා රැස්වීම සහ සමාගම විසුරුවා හැරීමේ නිවේදනය

තොලන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

(සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යටත්)

සමාගම් ලියාපදිංචි අංකය PV 67189

2007 අංක 07 දරන සමාගම් පනතේ 331(2) වගන්තිය යටතේ සෑහීමකට පත් වීමෙන් අනතුරුව ගණන් බේරා වසා දැමීමට යටත් සමාගමේ ගිණුම් සහ අනෙකුත් දේ සම්බන්ධයෙන් පවත්වන අවසන් මහා සභා රැස්වීම 2015 දෙසැම්බර් මස 11 වැනි දින පස්වරු 4.00 ට කොළඹ 04, කාසල් පටුමගේ අංක 11, 3 මහලෙහි පිහිටි එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් ආයතනයේ රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගම ඈවරකිරීමේ කටයුතු සිදුකළ ආකාරය
2. සමාගමේ වත්කම් උපලබ්ධි කළ ආකාරය සහ
3. අදළ අනෙකුත් විස්තර ලබා දීම සම්බන්ධයෙන්

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්
තොලන්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ඈවරකරුවන්.

2015 ඔක්තෝබර් මස 19 වැනි දින.

11-95

---

## දැන්වීමයි

අඩීම් යුනිෆෝම් (ප්‍රයිවට්) ලිමිටඩ් 2015 අගෝස්තු මස 18 වැනි දින සංස්ථාගත කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : අඩීම් යුනිෆෝම් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 107315
ලියාපදිංචි කාර්යාලය : අංක 216 ද, සේරම් පෙදෙස, කොළඹ 10.

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂ.

අඩීම් යුනිෆෝම් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

11-97

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය අනුව චාබඩ් ලංකා (ගරන්ටි) ලිමිටඩ් සමාගම 2015 ඔක්තෝබර් මස 01 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : චාබඩ් ලංකා (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ අංකය : ජී. එල්. 2340
ලියාපදිංචි ලිපිනය : අංක 70, ග්‍රීන් පාත්, කොළඹ 03.

කොපොරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.
චාබඩ් ලංකා (ගරන්ටි) ලිමිටඩ්.

11-98

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගමේ 9 (2) වගන්තිය අනුව පහත සඳහන් සමාගමේ නම වෙනස් කළ බවට කරනු ලබන නිවේදනයයි.

නම : එල් ඕ එල් සී රියලිටි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී බී 3854 පී. වී.
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය
වෙනස් වීමෙන් පසු සමාගමේ නව නාමය : ප්‍රොස්පර් රියලිටි (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එල්ඕඑල්සී කෝපොරේට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
ලේකම්වරු.

2015 ඔක්තෝබර් මස 13 වැනි දින.

11-108

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

රාජගිරිය, කලපලුවාව, නෙලුම් පෙදෙස, අංක 200/1E දරන ස්ථානයේ පදිංචි රුවන් පතිරණගේ කාන්ති දීපිකා පතිරණ වන මා විසින් දෙනු ලැබූ රාජගිරිය, කලපලුවාව, නෙලුම් පෙදෙස, අංක 200/1 E දරන ස්ථානයේ පදිංචි හර්ෂ කෞශල්‍ය වීරසිංහ යන අයට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව් සුනිල් ප්‍රේමවර්ධන විසින් ලියා සහතික කළ අංක 11563 සහ වර්ෂ 2007 ක් වූ අප්‍රේල් මස 25 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මහජනතාවට මෙයින් දන්වනු ලැබේ.

රුවන් පතිරණගේ කාන්ති දීපිකා පතිරණ.

11-110

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ආදවන් ඇක්වා ඇන්ඩ් මිනරල්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : PV 108879
ලියාපදිංචි කළ දිනය : 2015 ඔක්තෝබර් මස 6 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 40, ගිරේන්ඩ් බසාර්, මන්නාරම.

එස්. රාජකුලේන්ද්‍ර මිය,
නීතිඥ,

අංක 34/1, නෙල්සන් පෙදෙස,
වැල්ලවත්ත.
කොළඹ 06
(සමාගම් ලේකම්)

11-127

---

## දැන්වීමයි

''කළගෙඩිහේන, වෙස්ටර්න් පාර්ක්, අංක 23/137 දරන ලිපිනයේ පදිංචි රදම්පල ගමගේ අජිත් සිසිර කුමාර වන මා ඇටර්නි බලධාරි වූ සහ මාතර, හිත්තැටිය බටහිර, කුරුඳුවත්ත අංක 20 දරන ලිපිනයේ පදිංචි රදම්පල ගමගේ ජගත් උදය කුමාර යන අය ඇටර්නි බලකරු වූ හේමන්ත රත්නායක ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කළ අංක 193 සහ 2013.08.03 වැනි දින දරන දිනපොත් අංක 1586 යටතේ ගාල්ල දකුණු කලාප රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ලියාපදිංචි වී ඇති ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකාවාසී සියලු දෙනා වෙත මෙයින් දන්වා සිටිමි.''

11-129

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 3360 කැක්ටස් ගේට් මිසිසව්ගා ඔන්ටාරියෝ L5N8B2 හි පදිංචි බලයෝගිනි රාමනාදන් මහත්මිය සහ වෛද්‍ය වීරවගු රාමනාදන් යන අප විසින් අංක 14 කතිඅද්දී ෆුන්ට් ලෙන්තිරුනේල්වෙල්ලි උතුර යාපනයේ පදිංචි වල්ලිපුරම් තිලෛනාදන් යන අයට දී ඇති කැනඩාවේ ප්‍රසිද්ධ නොතාරිස් මයිකල් ඒ. රොමොෆ් යන අය විසින් 2014 වර්ෂයේ සැප්තැම්බර් මස 12 වැනි දින ලියා සහතික කරන ලද ඇටර්නි බලපත්‍රය අද සිට අවලංගු, නිෂ්ප්‍රභා අහෝසි, වන බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමු.

බලයෝගිනි රාමනාදන් මිය.
වෛද්‍ය වීරවගු රාමනාදන්.

11-148

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී

සමාගමේ නම : හබීබ් ට්‍රැවල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංක : පී වී 106905
සංස්ථාගත කළ දිනය : 2015 ජූලි 10
ලියාපදිංචි ලිපිනය : අංක 7/2/1, දෙවැන මහල, සුපර් මාර්කට්, බොරැල්ල.

11-150

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : හෙට්ටිආරච්චි ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 109045
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 1486/08, බැරෝඩා වත්ත, හෝකන්දර පාර, පන්නිපිටිය
සංස්ථාගත කළ දිනය : 2015.10.13
අධ්‍යක්ෂ : එම්. පී. එස්. හෙට්ටිආරච්චි.

11-153

---

### 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ජෙකෙවාන් ට්‍රේඩ් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 108926
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 210 - 3/5 සහ 3/6, එයාර්ටෙල් මාර්කට්, කෙලින් වීදිය, කොළඹ 11
සංස්ථාගත කළ දිනය : 2015.10.09
අධ්‍යක්ෂ : එම්. එස්. සල්සබීල්

11-154

---

### වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බව මෙයින් නිවේදනය කෙරේ

01. සමාගමේ නම : පී. ඒ. ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
02. සංස්ථාගත කළ දිනය : 2014.05.26
03. සමාගමේ අංකය : පී වී 98751
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 116, ලයාර්ඩ්ස් බ්‍රෝඩ්වේ, කොළඹ 14.

උදයන සී. කිරිදිගොඩ,
නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස් සහ සමාගම් ලේකම්.

අංක 451, නීතිඥ කාර්යාල සංකීර්ණය,
විලියම් ගොපල්ලව මාවත,
මහනුවර.

11-165/1

---

### වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බව මෙයින් නිවේදනය කෙරේ

01. සමාගමේ නම : සිලෝන් ග්‍රෑන්ඩ් ප්‍රොපර්ටි ඩිවෙලොපර්ස් (පීවීටී) එල්ටීඩී
02. සංස්ථාගත කළ දිනය : 2015.09.15
03. සමාගමේ අංකය : පී වී 108386
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 44/22, ඩේවි පාර, වටපුළුව, මහනුවර.

උදයන සී. කිරිදිගොඩ,
නීතිඥ ප්‍රසිද්ධ නොතාරිස් සහ සමාගම් ලේකම්.

අංක 451, නීතිඥ කාර්යාල සංකීර්ණය,
විලියම් ගොපල්ලව මාවත,
මහනුවර.

11-165/2

---

### වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බව මෙයින් නිවේදනය කෙරේ

01. සමාගමේ නම : ග්‍රෑන්ඩ් රිවර්බෑන්ක් රෙස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
02. සංස්ථාගත කළ දිනය : 2015.10.01
03. සමාගමේ අංකය : පී වී 108780
04. ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 472 සී, නව ගම්පොල පාර, පේරාදෙණිය.

උදයන සී. කිරිදිගොඩ,
නීතිඥ, ප්‍රසිද්ධ නොතාරිස් සහ සමාගම් ලේකම්.

අංක 451, නීතිඥ කාර්යාල සංකීර්ණය,
විලියම් ගොපල්ලව මාවත,
මහනුවර.

11-165/3

### විශේෂ ඇටෝර්නි බලපත්‍රය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් සහ සියලු මහජනතාවටත් දැන ගැනීම පිණිස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඕමල්පේ, දපනේ, අංක 44/03 දරන ස්ථානයේ පදිංචි විතාරණගේ කීර්ති සම්පත් (ජා. හැ. අංක 832262293 V) වන මා විසින් තංගල්ල, නලගම, ගොඩඋඩකන්ද ස්ථානයේ පදිංචි හේවා තොන්ඩිලගේ නන්දසීලි (ජා. හැ. අංක 635584009 V) නමැති අය වෙත ඇටෝර්නි බලය පවරමින් ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. ගුණවර්ධන විසින් ලියා සහතික කළ අංක 1015 සහ වර්ෂ 2015ක් වූ ජූලි මස 19 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ශූන්‍යකර බලරහිත කර සිටිමි.

මෙතැන් පටන් එකී තංගල්ල, නලගම, ගොඩකන්ද හි පදිංචි හේවා තොන්ඩිලගේ නන්දසීලි නමැති අය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ ඇතුළත්වනු ලබන කිසිදු ගිවිසුමක් සම්බන්ධයෙන් මා විසින් වගකියනු නොලබන බව ද, මෙයින් දැනුම් දෙමි.

විතාරණගේ කීර්ති සම්පත්.

11-166

### දැන්වීමයි

2007 අංක 7 දරන වෙළඳ සමාගම් ආඥාපනතේ 9 (1) ඡේදය අනුව පහත සමාගම සංස්ථාගත කළ බව මෙයින් දන්වා සිටිමු.

වෙළඳ සමාගමේ නම : ජූස් හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ලියාපදිංචි අංකය : පී වී 108508

ලියාපදිංචි කළ දිනය : සැප්තැම්බර් 21, 2015

ලියාපදිංචි කාර්යාලය : අංක 231, ගාලු පාර, කොළඹ 04.

අධ්‍යක්ෂකවරු.

11-176

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### මහජන බැංකුව - හලාවත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කොට්ඨාසයට අයත්, උතුරු පිටිගල් කෝරළේ ආනවිලුන්දාන් පත්තුවේ, කිරිවැල්කැලේ ග්‍රාමයේ පිහිටි, කිරිවැල්කැලේවත්ත ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු එම්. ගුණසේකර විසින් සාදන ලද 1999 අගෝස්තු මස 17 වැනි දිනැති අංක 2427 දරන පිඹුරේ ලොට් අංක 1 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 01 රූඩ් 01 පර්. 1.50 (හෙක්ටයාර 0.5097)

එහි පිහිටි පස, ගස්වැල්, පළතුරු, ගොඩනැගිලි සහ එහි පිහිටි සියල්ල සහිතව සහ ලොට් අංක 41 හි දැක්වෙන මාර්ගය පොදුවේ භාවිතා කිරීමේ අයිතිය සමග මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2015 නොවැම්බර් මස 24 වැනි අඟහරුවාදා දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*තීරණය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2012 අගෝස්තු මස 10 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2012 අගෝස්තු මස 02 වැනි දින දිනමිණ, ඩේලි නිවුස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*දේපළ වෙත පිවිසීම.* - හලාවත පුත්තලම ප්‍රධාන පාරේ මයියාව මංසන්ධිය පසුකර 89 වන කිලෝමීටර කණුව ආසන්නයේ දකුණුපසට ඇති ප්‍රාදේශීය සභා පාරේ කිලෝමීටර් 1.2ක් පමණ ගිය විට පාරේ වම් පසින් අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10%ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90%ක් (සියයට අනූවක්) වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය කළමණාකරු, මහජන බැංකුව, ප්‍රාදේශීය කාර්යාලය, මහජන බැංකු ගොඩනැගිල්ල (පළමු මහල), අංක 79, මාරවිල පාර, නාත්තන්ඩිය වෙත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුළු මුදල නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතු වේ.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් අදාළ විස්තර ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 032-2253300, 032-2253301

ෆැක්ස් අංකය : 032 - 2255247.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 123 ක සේවා විශිෂ්ටත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

11-141

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු විසින් ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ පහත දැක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ගිරුවාපත්තු දකුණේ, තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නෙතොල්පිටිය තංගල්ල ප්‍රාදේශීය සභාවේ, රන්න-බටහිර ග්‍රාම නිලධාරි සීමාව ඇතුළත රන්න ග්‍රාමයේ පිහිටා ඇති මීගහකොරටුව නමැති ඉඩමට බලයලත් මානක එච්. සිරිබද්ධන විසින් මැන සාදන වර්ෂ 2010.11.25 දිනැති අංක 4539 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද ලොට් 2 හි 2 බී දරන ඉඩම් කොටස සහ ඉඩම සහ ඒ මතවූ ගහකොළ, වැව්ලි සහ ඒ මත පිහිටි සියලු දේත් සමග වේ.

(බිම් ප්‍රමාණය : අක්. 0 රූඩ් 0 පර්. 13)

වර්ෂ 2015ක් වූ නොවැම්බර් මස 27 වැනි දින ප. ව. 1.30 ට

*දේපළට පිවිසෙන මාර්ගය.-* තංගල්ල නගරයේ සිට හම්බන්තොට පාර දිගේ කි. මී. 5ක් රන්න හන්දියෙන් වමට හැරී, රන්න වීරකැටිය පාර දිගේ මීටර් 15ක් පමණ ගමන් කළ විට දකුණට වන්නට විෂයගත දේපළට පිවිසිය හැක.

ප්‍රදීප් නිරෝෂන් ජයරත්න විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණු ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ජී. සී. නානායක්කාර විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2013.07.19 දිනැති අංක 13811 දරන සහ වර්ෂ 2013.07.19 දිනැති අංක 13813 දරන ප්‍රාථමික උකස් බැඳුම්කර මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2015.10.23 වැනි දින ඩේයිලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේ ම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය :-

1. ගැණුම් මුදලේ 10% ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්) ද,
4. ප්‍රචාරක වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද,
6. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු, ප්‍රධානී-ණය අයකර ගැනීම්, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 2565573/2565565, 011- 4667214, 011- 4667237, 011- 4667229

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස් සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3(50/3), විහාර මාවත,
කොළොන්නාව,
දුරකථන අංකය : 011 - 3068185,
ෆැක්ස් අංකය : 011- 2572940.

11-168

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මාතර දිසා අධිකරණයේ දී ය.

කොළඹ 01, බ්‍රිස්ටල් වීදියේ අංක 21 දරන ස්ථානයේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී එල් සී

..................................පැමිණිලිකරු

නඩු අංක :
2816/MB

එදිරිව

පුහුල්වැල්ල, කිරින්ද, මාතර පාරේ නිමාෂා ට්‍රේඩ් සෙන්ටර් හි දෙහිගස්පගේ විජිත්

......................................විත්තිකරු.

"ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් වී ඇති විකිණීමේ අධිකාරි පත්‍රය අනුව වර්ෂ 2014ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

ඒ අනුව ඉහත නම් සඳහන් කර ඇති විත්තිකරු විසින් පැමිණිලිකරුට,

(1) ගෙවීමට ඉතිරිව තිබෙන මුල් මුදල වන රු. 1, 213,328.14 ක මුදලක් සහ එකී ගෙවීමට ඉතිරිව තිබෙන මුල් මුදල මත 2011 මාර්තු මස 16 වැනි දිනට ලැබිය යුතු පොලිය වශයෙන් රු. 861,677.92 ක මුදලක් සහ එකී ගෙවීමට ඉතිරිව තිබෙන මුල් මුදල වන රු. 1,213,328.14 ක මුදල මත 2011 මාර්තු මස 17 වැනි දින සිට සම්පූර්ණ මුදල ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 29% බැගින් පොලිය ගෙවිය යුතු බවට සහ,

(2) තව ද, ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට අධිකරණයේ නිලධාරියකු විසින් නියමිත පරිදි තක්සේරු කරනු ලබන මෙම නඩුවේ නඩු ගාස්තු ගෙවිය යුතු බවට ද, නියෝග කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇත.

තව ද, තීන්දු ප්‍රකාශ සහ මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති සම්පූර්ණ බිම් කොටස ද, ඒ මත පිහිටි සියලුම ගොඩනැගිලි ද ඊට අයත් සහ අදාළ සියලුම අයිතිවාසිකම් ද තීන්දු ප්‍රකාශයේ සහ මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති පාරවල් සඳහා වෙන්වී ඇති කොටස් ද, එම බිම් කොටසින් බිම් කොටසට සහ ඒ මත විත්තිකරු වන දෙහිගස්පගේ විජිත් සතු සියලුම හුදල අයිතිවාසිකම් හිමිකම් පෑම් සහ ඉල්ලුම් ප්‍රසිද්ධ නොතාරිස් තැන්පත් සරත් ප්‍රිය සෙනරත් විසින් සහතික කරන ලද අංක 4424 සහ 2005 නොවැම්බර් මස 02 වැනි දින දරන උකස්කරය යටතේ සහ පරිදි නඩු නිමිත්ත මත ලැබිය යුතු ඉහත කී මුදල් අයකර ගැනීම සඳහා බන්ධනය වී ඇති බවට සහ ඇස්කීසි කළ හැකි බවට සහ එකී නඩු නිමිත්ත මත ඉහත කී මුදල් ප්‍රමාණයන් අයකර ගැනීම සඳහා එකී උකස්කරය බලාත්මක කිරීමට පැමිණිකරුට හිමිකම් ඇති බවට ද වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කරන ලද හෙයින් ද,

උකස්කර බලාත්මක කිරීමට පැමිණිලිකරුට හිමිකම් ඇති බවට ද, වැඩිදුරටත් නියෝග කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබේ.

වර්ෂ 2014ක් වූ ඔක්තෝබර් මස 15 වැනි දින මාතර දිසා අධිකරණ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරු අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී වර්ෂ 2015ක් වූ දෙසැම්බර් මස 11 වැනි දින ප. ව. 1.00 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

## උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, ගගබොඩපත්තුව ඇතුළත කිරින්දේ පිහිටි ජුල්ගහවත්ත නමැති ඉඩමේ අංක 03 බිම් කැබැල්ල ලෙස ලකුණු කර ඇති සීමා නිර්ණය කර ඇති එම සම්පූර්ණ බිම් කොටස එහි පිහිටි පස, වැවිලි, ගොඩනැගිලි සහ සියල්ල සහිතවයි. බලයලත් මිනින්දෝරු තැන්පත් එස්. එල්. ගලප්පත්ති මහතා විසින් සාදනු ලැබ මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි සී 506/282 යොමුව යටතේ ලියාපදිංචි කර ඇති සහ මාතර දිසා අධිකරණයේ අංක පී. 10632 දරන නඩුවට ගොනු කර ඇති අංක 2110 සහ 1983.10.11 වැනි දින දරන සැලැස්ම පරිදි එකී අංක 03 බිම් කැබැල්ලට මායිම් උතුරට : ජුල්ගහමඩිත්ත වෙන් කරන ඇල නැගෙනහිරට : වැව වෙන් කරන ඇල සහ පුවක්ගහමඩිවත්ත සහ එම ඉඩමේම අංක 02 බිම් කැබැල්ල, දකුණට : ගම්සභා පාර, බස්නාහිරට : එම ඉඩමේම අංක 4 සහ අංක 05 බිම් කැබැලි සහ එහි ප්‍රමාණය රූඩ් එකයි පර්චස් තුනයි දශම දෙකයි තුනක් (අ. 0, රූ. 1, පර්. 03.23) වේ.

*ඉඩමට පිවිසීම.* - කොළඹ සිට මාතරට පැමිණ මාතර සිට කිරින්දට ගොස් කිරින්ද නගරයට මීටර් 700ක් මෙහායින් දකුණට පුවක්ගහමඩිවත්ත ආරණ්‍ය පාර හමුවේ. එම පාරේ මීටර් 500ක් පමණ ගිය විට අදාල දේපළ වම්පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය* .- වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%) ගෙවිය යුතුයි. 2. නොතාරිස් ගාස්තු ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තු රු. 10,500 3. සියලු ප්‍රචාරක වියදම් 4. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු 5. රජයේ ගාස්තු හෝ පලාත් පාලන ආයතන ගාස්තු 6. ලිපිකරු බෙරකරු හා සෝෂක ගාස්තු රු. 4,500 7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑපහ (75%) මුදල දින 30ක් ඇතුළත දී මාතර දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතුයි.

ඔප්පු පරීක්ෂා කිරීමට සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෝෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස් වාණිජ
මහාධිකරණය සහ කොළඹ දිසා අධිකරණයේ
ගාල්ල දිසා අධිකරණයේ රාජ්‍ය හා වාණිජ
බැංකු බලයලත් වෙන්දේසිකරු.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12,
දුරකථන අංක 011 - 2445393/ 011 - 2396520.
Fax : 0112 -445393 Email : senaservice@sltnet.lk

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක 810, 2 වැනි මහල,
මරදාන පාර, කොළඹ 10
දුරකථන අංක 011 - 2672262/ 011 - 2672263.

11-151

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශේෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2015** | | | |
| **නොවැම්බර්** | 2015.11.06 | සිකුරාදා | 2015.10.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.13 | සිකුරාදා | 2015.10.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.20 | සිකුරාදා | 2015.11.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.11.27 | සිකුරාදා | 2015.11.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2015.12.04 | සිකුරාදා | 2015.11.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.12.11 | සිකුරාදා | 2015.11.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.12.18 | සිකුරාදා | 2015.12.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2015.12.23 | බදාදා | 2015.12.11 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2016** | | | |
| **ජනවාරි** | 2016.01.01 | සිකුරාදා | 2015.12.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.08 | සිකුරාදා | 2015.12.23 | බදාදා | දහවල් | 12.00 |
| | 2016.01.14 | බ්‍රහස්පතින්දා | 2016.01.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.22 | සිකුරාදා | 2016.01.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2016.01.29 | සිකුරාදා | 2016.01.14 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.